ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2022-09-07

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩී.කේ. ධර්මසේකර මිය.<br>154/8, විජයතන්දාරාම පාර,<br>ගොත්තන්තර,<br>පිලියන්දල. |
| වගඋත්තරකාර පාර්ශවය | 01 | විදුහල්පති,<br>ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය,<br>මිලාගිරිය,<br>කොළඹ 05. |
| | 02 | අධ්‍යක්ෂ (ජාතික පාසල් ශාඛාව),<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |

<u>පැමිණිලි අංකය : එච්ආර්සී/3297/19</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම**

ඉහත පැමිණිලිකාරිය විසින් 2019-11-07 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ල සහ පැමිණිල්ලට අදාළව පසුව ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු මගින් ප්‍රකාශ කර ඇත්තේ තමා කොළඹ ශාන්ත පාවුළු බාලිකා විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කරමින් සිටින බවත් 2019-10-17 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අංශය භාර අධ්‍යක්ෂ ධම්මිකා ජයනෙත්ති මහත්මියගේ අත්සනින් තමාගේ ඉල්ලීම සහ සේවා අවශ්‍යතාවය මත ශාන්ත පාවුළු බාලිකා විදුහලේ සිට කොළඹ විශාඛා විද්‍යාලය වෙත ස්ථාන මාරුවක් ලබාදී ඇති බවත් එම ස්ථාන මාරුව පරිදි තමන් ශාන්ත පාවුළු බාලිකා විදුහලෙන් නිදහස් කිරීමට මෙනෙක්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர்: 011-2505451
ෆැක්ස් / தொலைநகல்: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல்

එහි විදුහල්පතිනිය කටයුතු නොකිරීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව සහ ඒ
සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදු කර තම ස්ථාන මාරුව අනුව කොළඹ විශාඛා විදුහලේ
සේවයට වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව
වෙතින් ඉල්ලා ඇත.

### වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම

### විදුහල්පතිනි, ශාන්ත පාවුළු බාලිකා විදුහල, කොළඹ කරුණු දැක්වීම

විදුහල්පතිනි සුමේධා
මෙම පැමිණිල්ලට අදාළව කොමිෂන් සභාවේ දැන්වීම පරිදි එම විදුහලේ විදුහල්පතිනි සුමේධා
ජයවීර මිය විසින් ලිඛිත කරුණු දැක්වීම් කිහිපයක් සිදු කර ඇති අතර කැඳවා ඇති පරීක්ෂණ
අවස්ථාවන් හිදී විදුහල්පතිවරිය වෙනුවෙන් නියෝජිතයින් සහභාගි කරවා ඇති අතර එම
නියෝජිතයින් විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම් වල සදහන් කරුණු අදාළ
කරගෙන කරුණු ඉදිරිපත් කර ඇත. එනම් මෙම පැමිණිලිකාරිය වන කුසලා ධර්මසේකර ගුරු
මහත්මිය තම පාසලේ නාවික ශිෂ්‍ය භට කණ්ඩය භාර ගුරුවරිය බවත් ඇය වෙනුවට
අනුප්‍රාප්තිකයෙකු පත් නොකර කොළඹ විශාඛා විද්‍යාලයට ස්ථාන මාරුව සිදු කර ඇති බවත් ඒ
හේතුවෙන් තම විදුහලේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යාවන් භාරදහසකගේ පමණ හිමිකම් උල්ලංඝණය
වීමේ තත්වයක් උද්ගත වී ඇති බැවින් අනුප්‍රාප්තිකයෙකු ලබා දෙනතුරු පැමිණිලිකාර ගුරු
මහත්මිය තම පාසලෙන් නිදහස් කිරීමට කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවත් එය
විදුහල්පතිනිය ලෙස අනුගමනය කළහැකි නිවැරදිම ක්‍රියාමාර්ගය බවත් ප්‍රකාශ කර ඇත. තවද
යම් ගුරුවරියක් සෞඛ්‍ය හේතු මත හෝ අතිශය සාධාරණ කරුණු හේතුකොට ගෙන ස්ථාන
මාරුවක් ලබා ගන්නේ නම් මානුෂීය හේතු මත කටයුතු කළහැකි වුවත් මෙම ගුරුවරිය තම
ස්ථාන මාරුව සදහා හේතුව ලෙස දක්වා ඇත්තේ පදිංචි ස්ථානය වෙනස් කිරීම බවත් ප්‍රකාශ
කර ඇත. තවද ධර්මසේකර ගුරු මහත්මිය තම පාසලෙන් නිදහස් කිරීමකින් තොරව කොළඹ
විශාඛා විදුහලේ රාජකාරි භාර ගැනීමද ගැටළු සහගත තත්වයක් බවත් යම් ගුරු භවතෙකුට
වෙනත් පාසලක රාජකාරි භාර ගතහැක්කේ වර්තමාන රාජකාරි කරන පාසලේ විදුහල්පති
විසින් නිදහස් කිරීමේ ලිපිය නිකුත් කිරීමෙන් පසුව බවත් විශාඛා විදුහලේ විදුහල්පතිනිය තම
නිදහස් කිරීමේ ලිපිය නොමැතිව එම ගුරු මහත්මියට රාජකාරි භාරදීමද ගැටළු සහගත බව
2022-01-11 දිනැති ලිඛිත කරුණු දැක්වීමේ 5 වන ඡේදය යටතේ දක්වා ඇත. තමා මේ
සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතද කරුණු ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව තම
කරුණු දැක්වීම් සැලකිල්ලට ගෙන එම ගුරුවරියගේ ස්ථාන මාරුව අවලංගු කිරීමට කටයුතු කර
පාසලට සාධාරණය ඉෂ්ඨ කර දෙන ලෙස ඉල්ලා ඇත. මීට අමතරව 2022-04-26 දිනැතිව මෙම
පැමිණිල්ලට අදාළව වැඩිදුර ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති වගඋත්තරකාරිය
ප්‍රකාශ කර ඇත්තේ කුසලා ධර්මසේකර මිය දෙවන ලුතිනන් නිලයක් දරණ ගුරුවරියක් බවත්
ඇය තම පාසලේ ශිෂ්‍ය භට කණ්ඩය භාරව කටයුතු කරන බවත් 2015 වසරේ තමා විදුහල්පති
ලෙස මෙම පාසලේ රාජකාරි භාර ගන්නා විට පැමිණිලිකාරිය කාලසටහනක් පවා නොමැතිව
නිකරුණේ කාලය ගත කර ඇති බවත් තමා විසින් ඇය වෙත ශිෂ්‍ය භට කණ්ඩයේ කටයුතු
මෙහෙයවීම සහ කාලසටහනක් ද ලබාදීමට කටයුතු කල බවත් පවසා ඇත. ඒ අනුව මෙම
ගුරුවරිය මෙන් නිලයක් සහිත ගුරුවරියක් නොමැතිව ශිෂ්‍ය භට කණ්ඩයක් පාසලක පවත්වා
ගෙන යාමට නොහැකි බවත් එවැනි නිලධාරිණියක් නොමැතිව ශිෂ්‍ය භට කණ්ඩයක් කදවුරු ගත
කිරීමද කළ නොහැකි බවත් පෙන්වා දී ඇත. ඒ අනුව ධර්මසේකර ගුරු මහත්මිය මෙන් නිලයක්
දරණ ගුරු මහත්මියක් තම පාසලට ලබා දීමෙන් ඒ මහත්මිය තම පාසලෙන් නිදහස් කිරීමට
හැකි බවත් මේ සම්බන්ධව තම අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සහ ගුරු මාරු අධ්‍යක්ෂවරියද
අවස්ථා ගණනකදී දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවත් ඒ අනුව මෙහිදී තමන් නීතියට

පටහැනිව කටයුතු කර නොමැති බවත්, තමන් මෙම පැමිණිල්ලේ වගඋත්තරකාර ලැයිස්තුවෙන් ඉවත් කර තිසි වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙසද ඉල්ලා ඇත.

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කරුණු දැක්වීම**

මෙම පැමිණිල්ලට අදාළව කැඳවා ඇති පරීක්ෂණ සඳහා ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නීතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා සහභාගී වී ඇති අතර එහිදී සහකාර අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර ඇත්තේ මේ සම්බන්ධව අදාළ පාසල් දෙක වෙතින්ම ලිඛිතව කරුණු විමසා ඇති බවත් ඒ අනුව කොළඹ විශාඛා විද්‍යාලයේ පැමිණිලිකාර ගුරුවරිය 10, 11, 12, සහ 13 ශ්‍රේණි සඳහා ඉංග්‍රීසි සාහිත්‍ය විෂය ඉගැන්වීමේ කටයුතු වල නිරතව සිටින බවත් ඊට අමතරව ශිෂ්‍ය භට තූර්ය වාදක කණ්ඩායම භාරවද මෙම ගුරුවරිය කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ශාන්ත පාවුළු බාලිකා විදුහලේ දින 2 ක් සේවයට අනුයුක්ත කර ඇති බැවින් ඒ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන ලෙස එම පාසලේ විදුහල්පතිනිය වෙත දන්වා ඇතත් 2022-04-27 දින මෙම පරීක්ෂණයට සහභාගී වන දින තෙක් අදාළ විදුහල්පතිනිය ඒ සම්බන්ධව ප්‍රතිචාර දක්වා නොමැති බව ප්‍රකාශ කර ඇත. තවද ශිෂ්‍ය භට කණ්ඩ වල කටයුතු කිරීම සඳහා ගුරුවරුන් පාසල් වලට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුයුක්ත නොකරන බවත් ඒ අනුව ශාන්ත පාවුළු බාලිකා විදුහල සඳහා ශිෂ්‍ය භට කණ්ඩයේ කටයුතු කිරීමට ගුරු භවතෙකු ලබා දීම සම්බන්ධ කාරණයට අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත්ව කටයුතු නොකරන බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම පැමිණිල්ලේ විෂයගත කාරණය සම්බන්ධ ගැටළුව නිරාකරණය කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව කඩිනමින් නිර්දේශයක් ලබා දෙන්නේ නම් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට අවශ්‍ය පියවර ගතහැකි බවද ප්‍රකාශ කර ඇත.

**විමර්ශනය**

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ලට අදාළව ලබාදී ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයේදී පැමිණිලිකාරිය කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ තමන් ශාන්ත පාවුළු බාලිකා විදුහලේ ශිෂ්‍ය භට කණ්ඩායමේ කටයුතු වලින් 2019 වර්ෂයේ ජනවාරි මස 20 දිනෙන් පසුව ඉවත් වන බවට ලිඛිතවම විදුහල්පතිනිය වෙත දන්වා ඇති බවත් එම ලිපියේ පිටපතක් ද මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවයි. තවද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් තමා වෙත ලබාදී ඇත්තේ ඉංග්‍රීසි ගුරු පත්වීමක් බවත් ශාන්ත පාවුළු බාලිකා විදුහලේ තමන් ශිෂ්‍ය භට කණ්ඩයේ කටයුතු වලට ස්වේච්ඡාවෙන් තම දායකත්වය ලබාදී ඇති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත් මෙතෙක් තමන් වැටුප් ලබා ගැනීම සිදු කරනු ලබනුයේ ශාන්ත පාවුළු බාලිකා විදුහලෙන් බවත් තම ස්ථාන මාරුව විශාඛා විදුහල වෙත ලබාදී ඇති බව සහ ඒ අතරතුර ශාන්ත පාවුළු බාලිකා විදුහලට අනුයුක්තවද දින 02 ක් කටයුතු කරන බවද ප්‍රකාශ කර ඇත. තවද ශාන්ත පාවුළු බාලිකා විදුහලේ ශිෂ්‍ය භට කණ්ඩයේ කටයුතු සඳහා දේවි නමැති ගුරු මහත්මියක් සිටින බවත් එම විදුහලට අනුයුක්ත කර ඇති දින 02 තුළ තමන් වෙතින් එම පාසලට කිසිදු සේවයක් සිදු නොවන බවත් එම පාසලේ විදුහල්පතිනිය විසින් හිතාමතාම තමන් අපහසුතාවයට ලක් කිරීම සඳහා තමා විශාඛා විදුහලට නිදහස් කිරීමේ ලිපිය ලබා නොදී සිටින බවද ප්‍රකාශ කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව ඉහත පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් වලට අනුව විශේෂයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් පැමිණි නියෝජිතයා විසින් ලබාදී ඇති වාචික කරුණු දැක්වීම් අනුව පැමිණිලිකාරිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයෙන් විශාඛා විදුහල වෙත නිදහස් නොකිරීම පිළිබඳව එම පාසලේ විදුහල්පතිනිය වෙතින් සිදු කර ඇති කරුණු

විමසීම සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදැක්වීම පිළිබඳ කාරණය විශේෂයෙන් වැදගත් වේ. අනෙක් අතට මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පැමිණිලි පාර්ශවය විසින් වගඋත්තරකරු ලෙස නම් කර ඇති ශාන්ත පාවුළු බාලිකා විදුහල්පතිනි සුමේධා ජයවීර මිය ලිඛිත කරුණු දැක්වීම් කොමිෂන් සභාව වෙත ලබාදී ඇතත් වාචිකව කරුණු දැක්වීම සඳහා සිතාසි මගින් කැඳවා තිබූ පරීක්ෂණ වලට සහභාගී වී නොමැති අතර ඒ සඳහා වෙනත් නියෝජිතයින් සහභාගී කරවා ඇති බව තිරික්ෂණය වේ.

**නිරික්ෂණ**

- පැමිණිලිකාරිය වෙත අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදී ඇති පත්වීම ඉංග්‍රීසි විෂය සම්බන්ධ ගුරු පත්වීමක් බව.
- 2019-10-17 දිනැතිව පැමිණිලිකාරිය හට කොළඹ විශාඛා විදුහල වෙත ලබාදී ඇති ස්ථාන මාරුව එම ගුරු මහත්මියගේ ඉල්ලීම මත සහ සේවා අවශ්‍යතාවය මත ලබාදී ඇති බව.
- එම ස්ථාන මාරු ලිපියේ ශාන්ත පාවුළු බාලිකා විදුහලේ ශිෂ්‍ය හට කණ්ඩයේ කටයුතු ආවරණය සම්බන්ධව සඳහනක් නොමැති බව.
- පැමිණිලිකාරිය සතියේ දින 3 ක් විශාඛා විදුහලේ සහ දින 2 ක් ශාන්ත පාවුළු බාලිකා විදුහලේ සේවයේ නිරත වන බව.
- පැමිණිලිකාරිය ප්‍රකාශ කරන පරිදි ශාන්ත පාවුළු බාලිකා විදුහලේ ශිෂ්‍ය කණ්ඩයේ කටයුතු සඳහා වෙනත් ගුරු මහත්මියක සිටින බව.
- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ශිෂ්‍ය හට කණ්ඩ වල කටයුතු හෝ තූර්ය වාදක කණ්ඩායම් කටයුතු සඳහා ගුරු භවතුන් සේවයට බඳවා නොගන්නා බව සහ අදාළ ගුරුවරුන් ස්වේච්ඡාවෙන් එම කටයුතු වල නිරත වන බව.
- මෙම ප්‍රශ්නගත කාරණය සම්බන්ධව වසර 2 1/2 ක පමණ කාලයක් ගතවී ඇතත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව අවසන් තීරණයක් ගෙන නොමැති බව.

**නිගමනය**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු ආශ්‍රයෙන් ඉහත තිරික්ෂණය වී ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී පැමිණිලිකාරිය වෙත 2019-10-17 දිනැතිව ලබාදී ඇති ස්ථාන මාරුව පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉටු කරදී නොමැති අතර ඒ සඳහා ශාන්ත පාවුළු බාලිකා විදුහලේ විදුහල්පතිනිය විසින් පැමිණිලිකාරිය එම පාසලෙන් නිදහස් නොකිරීම හේතුවී ඇත. ඒ අනුව එම පාර්ශවකරුවන්ගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් පැමිණිලිකාරිය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් හිමිකර දී ඇති නීතිය ක්‍රියාත්මක කිරීම සාධාරණව සිදු විය යුතුය යන මූලික අයිතිවාසිකම උල්ලංඝණය වී ඇති බව නිගමනය කරමි.

**නිර්දේශය**

ඒ අනුව පැමිණිලිකාරිය වන කුසලා ධර්මසේකර මිය වෙත කොළඹ විශාඛා විදුහල වෙත 2019-10-17 දින ලබාදී ඇති ස්ථාන මාරුව පරිදි විශාඛා විදුහලේ රාජකාරි කටයුතු සම්පූර්ණයෙන් ඉටු කිරීම සඳහා කොළඹ ශාන්ත පාවුළු බාලිකා විදුහල වෙතින් ඇයව නිදහස් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මගින් එම විදුහලේ විදුහල්පතිනිය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.10.12 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
රේ/ Room 06

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : ලේකම්, - ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීම සඳහා.
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.